# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2268/10 – 2022 පෙබරවාරි මස 21 වැනි සඳුදා – 2022.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 64 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/16/2018/UDA/470.
ප්‍රා.ලේ යොමු අංකය: කොප්‍රාලේ/ඉඅත්/3/107/UDA.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා දෙන ලද වෙතත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 පෙබරවාරි මස 16 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා;** ප්‍රාදේශීය ලේකම්, කොළඹ.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බ්ලූමැන්ඩල් ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, බ්ලූමැන්ඩල් (කොට්ඨාස අංක 6 - බ්ලූමැන්ඩල් කොළඹ මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක CO/COL/2020/416 හා 2020.10.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අංක 01 - 312 වත්ත (කොටසක්) - ප්‍රමාණයඃ හෙක්. 0.0924**

උතුරටඃ ඇළ; නැගෙනහිරට: ඇළ සහ සිරිල් සී පෙරේරා මාවතේ වරිපනම් අංකය සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම; දකුණට: සිරිල් සී පෙරේරා මාවතේ වරිපනම් අංකය සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම සහ නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන 312 වත්ත; බටහිරට: නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන 312 වත්ත සහ ඇළ.

EOG 02 - 0569


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*